# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA



| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| --- | --- |
| දිනය | 2023 දෙසැම්බර් 13 |


ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) විධායක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව සමග මාස 48ක විස්තීර්ණ ණය අරමුදල් පහසුකම යටතේ පළමු සමාලෝචනය සම්පූර්ණ කරන ලද අතර, එමගින් ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ සඳහා සහය වීම සඳහා විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) මිලියන 254ක (එ.ජ. ඩොලර් මිලියන 337ක් පමණ) මූල්‍යන පහසුකමක් සඳහා ශ්‍රී ලංකාවට ප්‍රවේශය හිමිවිය. ජා.මූ. අරමුදල විසින් 2023 දෙසැම්බර් 12වන දින පහත දැක්වෙන මාධ්‍ය නිවේදනය නිකුත් කරන ලද අතර, එයට පහත සබැඳියෙන් ප්‍රවේශ විය හැකිය.

https://www.imf.org/-/media/Files/News/press-release/2023/pr23439-sinhala-sri-lanka.ashx

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය ශ්‍රී ලංකාව සමග පවතින විස්තීර්ණ ණය පහසුකම යටතේ සිදු කළ පළමු සමාලෝචනය සම්පූර්ණ කරයි

- ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව සමග මාස 48ක විස්තීර්ණ ණය අරමුදල් පහසුකම යටතේ පළමු සමාලෝචනය සම්පූර්ණ කරන ලද අතර, එමගින් ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ සඳහා සහාය වීම සඳහා වි.ගැ.හි. මිලියන 254ක (එ.ජ. ඩොලර් මිලියන 337ක් පමණ) මූල්‍යන පහසුකමක් සඳහා ශ්‍රී ලංකාවට ප්‍රවේශය හිමිවිය.
- මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ කාර්ය සාධනය සතුටුදායක විය. එක් කාර්ය සාධන නිර්ණායකයක් හැර අනෙකුත් සියලුම නිර්ණායක මෙන්ම, එක් දර්ශක ඉලක්කයක් හැර අනෙකුත් සියලුම දර්ශක ඉලක්ක ද ජූනි මස අවසානයේ දී සපුරා ගන්නා ලදී. 2023 ඔක්තෝබර් මස අග වන විට ව්‍යුහාත්මක මිණුම් දඬු සපුරා ගෙන හෝ ප්‍රමාදයක් සහිතව ක්‍රියාත්මක කර ඇත. ජා.මූ. අරමුදලේ පාලන නිර්ණය පිළිබඳ ක්‍රියාවලිය සිදුකළ පළමු ආසියානු රට බවට ශ්‍රී ලංකාව පත්වෙමින්, බලධාරීන් විසින් පාලන නිර්ණ වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී.
- ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම, රජයේ ආදායම් ඉහළ නැංවීම, සංචිත ස්වාරක්ෂක නැවත ගොඩ නැගීම, උද්ධමනය අඩු කිරීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීම උදෙසා බලධාරීන් ප්‍රශංසනීය ප්‍රගතියක් ලබා ඇත. පාලනය (governance) වැඩිදියුණු කිරීම සහ දුප්පත් සහ අවදානමට ලක්විය හැකි ජනතාව ආරක්ෂා කිරීම සඳහා දැඩි කැපවීම ඉතා වැදගත් වේ.

**වොෂින්ටන් - 2023 දෙසැම්බර් 12:** ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය මාස 48ක විස්තීර්ණ ණය පහසුකම යටතේ පළමු සමාලෝචනය අද සම්පූර්ණ කළේය. පළමු සමාලෝචනය සම්පූර්ණ කිරීම මගින් වි.ගැ.හි. මිලියන 254ක් (එ.ජ. ඩොලර් මිලියන 337ක් පමණ) වහාම ලබා දීමට ඉඩ සැලසෙන අතර ජා.මූ. අරමුදලෙන් මේ දක්වා ලබා දී ඇති මුළු මූල්‍ය සහාය වි.ගැ.හි. මිලියන 508ක් (එ.ජ. ඩොලර් මිලියන 670ක් පමණ) වේ.

2023 මාර්තු 20 වැනි දින ජා.මූ. අරමුදලේ වැඩසටහන අනුමත කරන විට ශ්‍රී ලංකාවේ විස්තීර්ණ අරමුදල් පහසුකම යටතේ මුළු මුදල වි.ගැ.හි. බිලියන 2.286ක් (එ.ජ. ඩොලර් බිලියන 3ක් පමණ) විය (මාධ්‍ය ප්‍රකාශය බලන්න https://www.imf.org/en/News/Articles/2023/03/20/pr2379-imf-executive-board-approves-under-the-new-eff-arrangement-for-sri-lanka). සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීම සහ වර්ධනය ඉලක්ක කරගත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයන්ට ජා.මූ. අරමුදලේ වැඩසටහන සහාය වේ.

ශ්‍රී ලංකාව පිළිබඳ විධායක මණ්ඩල සාකච්ඡාවෙන් අනතුරුව නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ කෙන්ජි ඔකමුරා මහතා පහත ප්‍රකාශය නිකුත් කළේය.

"සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ඵල දැරීමට පටන් ගෙන ඇති අතර, ශීඝ්‍ර නිරුද්ධමනය, ආදායම් මත පදනම් වූ සැලකිය යුතු රාජ්‍ය මූල්‍ය ගැලපීම සහ සංචිත ගොඩ නැගීම සමඟ ආර්ථිකය ස්ථාවර වීමේ තාවකාලික සලකුණු පෙන්නුම් කරයි.

"විස්තීර්ණ අරමුදල් පහසුකමෙන් සහාය දක්වන ජා.මූ. අරමුදලේ වැඩසටහන යටතේ කාර්ය සාධනය සතුටුදායක වේ. හිඟ වියදම් පිළිබඳ නිර්ණායකය හැර, ජූනි අවසානය සඳහා සියලුම ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක සපුරා ඇත. බදු ආදායම හැර අනෙකුත් සියලුම දර්ශක ඉලක්ක සපුරා ඇත. බොහෝ ව්‍යුහාත්මක මිණුම් දඬු 2023 ඔක්තෝබර් අවසානය වන විට ක්‍රියාත්මක කර හෝ ප්‍රමාද වී හෝ ක්‍රියාවට නංවා ඇත. ජා.මූ. අරමුදලේ වැඩසටහන යටතේ ව්‍යුහාත්මක මිණුම් දණ්ඩක් වන පාලන නිර්ණ වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම ගැඹුරින් මුල් බැසගත් දූෂණ දුර්වලතා සඳහා විසඳුම් ලබාදීමේ ප්‍රශංසනීය පළමු පියවරකි. මෙවැනි වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම ආසියාවේ ප්‍රථම වරට සිදුව ඇත. පාලනය වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩ කැපවීම සහ වාර්තාවේ නිර්දේශ කාලානුරූපව ක්‍රියාත්මක කිරීම මගින් සියලුම පුරවැසියන්ට සැලකිය යුතු ආර්ථික වාසි ලබා ගත හැකිය.

"ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් නිල ණය හිමියන්ගේ කමිටුව සහ චීනයේ අපනයන-ආනයන බැංකුව සමඟ ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තිමය ගිවිසුම් විස්තීර්ණ අරමුදල් පහසුකමෙහි ඉලක්කවලට අනුකූල වේ. මෙම ගිවිසුම් ශ්‍රී ලංකාවේ ණය තිරසාරත්වය කරා යන මාවතට ගෙන යන වැදගත් සන්ධිස්ථානයකි. නිල ණය හිමියන් සමඟ අවබෝධතා ගිවිසුම් කඩිනමින් නිම කිරීම සහ අත්සන් කිරීම වැදගත් වේ. ගිවිසුම් කාලානුරූපව ක්‍රියාත්මක කිරීම සහ සංසන්දනාත්මක කොන්දේසි මත විදේශීය පුද්ගලික ණය හිමියන් සමඟ විසඳුමකට එළඹීම හරහා මධ්‍ය කාලීනව ශ්‍රී ලංකාවේ ණය තිරසාරභාවය නැවත ස්ථාපිත කළ හැකිය.

"පූර්ණ හා වේගවත්ව නැවත යථා තත්ත්වයට පැමිණීම සහතික කිරීම සඳහා, ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිසංස්කරණවල හිමිකාරිත්වය පවත්වා ගැනීම අතිශය වැදගත් වේ. ප්‍රධාන ප්‍රමුඛතා අතරට රාජ්‍ය ආදායම වර්ධනය කිරීම, බලශක්ති මිල ගණන් පිරිවැය සමඟ පෙළගැස්වීම, සමාජ ආරක්ෂණ දැල් ශක්තිමත් කිරීම, සංචිත ස්වාරක්ෂක නැවත ගොඩනැගීම, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීම, දූෂණය පිටුදැකීම සහ පාලනය වැඩිදියුණු කිරීම ඇතුළත් වේ.

"ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණයන්හි සහාය ඇතිව ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ශක්තිමත් කිරීම මගින් ජා.මූ. අරමුදලේ වැඩසටහන ක්‍රියාත්මක

කිරීමේ දී ඇතිවන අපහසුතා මගහැර ගැනීමට සහ අතීතයේ ප්‍රතිපත්තිමය ක්‍රියමාර්ගවල සිදුවූ අඩුපාඩුකම්වලින් මිදීමට ඉතා වැදගත් වේ.

"ශ්‍රී ලංකා මහ බැංකුව සිය උද්ධමනය ඉලක්ක කරගත් මුදල් ප්‍රතිපත්ති රාමුවේ විශ්වසනීයත්වය ආරක්ෂා කර ගැනීම සඳහා බහුවිධ නිරුද්ධමන උපාය මාර්ග කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කළ යුතුය. විනිමය අනුපාත නම්‍යශීලී බව මගින් විදේශ සංචිත ඉහළ නැංවීමට කටයුතු කිරීම විස්තීර්ණ අරමුදල් පහසුකම යටතේ වැදගත් ප්‍රමුඛතාවයක් ලෙස පවතී.

"බැංකු ප්‍රාග්ධනීකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ මූල්‍ය අධීක්ෂණය හා අර්බුද කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා ඉතා වැදගත් වේ.

"සමාජ ආරක්ෂණ ජාලය තවදුරටත් ශක්තිමත් කිරීම සහ සමාජ වියදම් පවත්වා ගෙන යාම දුප්පත් සහ අවදානමට ලක්විය හැකි ජනතාව ආරක්ෂා කිරීම සඳහා ඉතා වැදගත් වේ.